**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2015**

---

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය එවකට මහා මාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතියේ අරමුණ වූයේ ජාතික අධිවේගී මාර්ග පද්ධතියේ කොටසක් වූ අවසානයේදී කොළඹ සහ උතුරු මැද පලාතේ දඹුල්ල සම්බන්ධවන ආකාරයට කිලෝමීටර් 182 කින් යුත් මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමයි. අදියර 04 ක් යටතේ නුවර නගරයට සම්බන්ධ කෙරෙන පරිදි ඉදිකිරීම් කටයුතු කිරීමට නියමිත විය. 2017 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියේ මූල්‍ය සැකැස්ම හා එහි කාලපරිච්ඡේදය අවසන් කර නොතිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයේ අරමුදලින් සපයන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වන වත්කම් සහ වගකීම්, හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණුවිට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලැබූ රු.මිලියන 1,409.10 ක දායක මුදල, අරමුදල් මූලාශ්‍රයන් යටතේ දක්වනු වෙනුවට ජංගම නොවන වගකීම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 1.66 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ සහ ප්‍රවර්තන වගකීම් යටතේ වූ ශේෂයන් අඩුවෙන් දැක්විණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුල සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල | | | |
|---|---|---|---|---|---|
| | | සමාලෝචිත වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ශ්‍රී ලංකා රජය | 200.00 | 0.55 | 75.60 | 10.28 | 1,409.10 |
| එකතුව | 200.00 | 0.55 | 75.60 | 10.28 | 1,409.10 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බලපත් ලාභී විශේෂිත බැංකුවක් මගින් ලබාගත් ණය මුදලකින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාදුන් රු.මිලියන 335.90 ක මුදලින් ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ණය පියවීම සඳහා ව්‍යාපෘතිය මගින් සිදුකරන ලද වැඩ පිළිවෙල විගණනය සඳහා පැහැදිලි කර නොතිබුණි.

(ආ) ඉහත තොරතුරු අනුව, නිසි පිරිවැය ඇස්තමේන්තු නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කළ රු.මිලියන 200 ක ප්‍රතිපාදන අගයෙන් රු. මිලියන 75.6 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

-----------------

2007 – 2017 දක්වා ජාතික මහාමාර්ග සැලැස්ම යටතේ එඬේරමුල්ලේ සිට දඹුල්ල දක්වා උතුරු අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 100 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. අදියර 04 ක් යටතේ ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර පොතුහැර සිට ගලගෙදර දක්වා මධ්‍යම අධිවේගී මාර්ගයට සම්බන්ධ වේ. කෙසේ වෙතත්, උතුරු අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා වූ යෝජනාව අත්හිටුවන ලද අතර, කඩවත සිට දඹුල්ල දක්වා වූ කිලෝමීටර් 182 ක් වූ මහනුවර නගරයට සම්බන්ධ වන මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමට 2015 ජූලි 16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

උපදේශ සේවා සඳහා වූ මුල් කොන්ත්‍රාත්තුව ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 4.00 කට සමාන වූ රු.මිලියන 543.94 ක් සහ බදු රහිත රු.මිලියන 414.23 කට ඕස්ට්‍රේලියානු සමාගමකට 2013 ජනවාරි 09 දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, මාර්ගයේ ඉදිකිරීම් කටයුතු වෙනස්වීම් සහ මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ ඕස්ට්‍රේලියානු තත්ත්ව ප්‍රමිතීන් වෙන්ව චීන තත්ත්ව ප්‍රමිතිවලට යොදා ගැනීම හේතුවෙන් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 6.34 කට සමාන වූ රු.මිලියන 757.69 සහ රු.මිලියන 583.07 දක්වා වූ බදු රහිත අගයකට උපදේශක සේවා කොන්ත්‍රාත් පිරිවැය වැඩිවී තිබුණි. තවද, චීන තත්ත්ව ප්‍රමිතීන් අනුගමනය කිරීමට අදාල තිරස් දිශානුකරණය, සිරස් පැතලි කිරීම, හරස්කඩ සහ ආරම්භක ක්ෂේත්‍රීය මිණුම් පදනම් වූ සමීක්ෂණ, මූලික භූ තාක්ෂණ සමීක්ෂණ සහ ආරම්භක ජල විද්‍යා සමීක්ෂණ යනාදියට අදාල අනුමත කිරීමේ ලිපිය විගණනය සඳහා ඉදිරිපත් නොවීය. මීට අමතරව උපදේශක සේවා සඳහා බදු නිදහස් කිරීම් ලබාගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය මගින් රු.මිලියන 274.08 ක මුදලක් බදු සඳහා වැය කිරීමට සිදුවිය.

**3.4 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු**

-------------------------------------

මුදල් රෙගුලාසි 756 ට අනුව 2015 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් සඳහා වාර්ෂික සමීක්ෂණයක් ව්‍යාපෘතිය විසින් සිදුකර නොතිබුණි. තවද, මාර්ග සංවර්ධන අධිකාරියෙන් මාරු කරන ලද දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අයිතම කිහිපයක් නැවත ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේදී උපදේශකවරුන් 15 දෙනෙකු සහ පොදු සම්බන්ධීකරණ නිලධාරීන් දෙදෙනෙකු පත්කරන ලද බව නිරීක්ෂණය වූ අතර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවැනි තනතුරු අනුමත කර නොතිබුණි. තවද, උපදේශකවරුන් 10 දෙනෙකුගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.